Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 07 - 2023

# පෙරදිග සංගීතය

කාලය පැය 2යි

නම / විභාග අංකය:

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. "පොත පත කියවා නුවණ ලබා" මෙම ගී පාදය,
   i. කෝමල ස්වර ස්ථාපන ගී පාදයකි. ii. ශුද්ධ ස්වර ස්ථාපන ගී පාදයකි.
   iii. පොත් ගැන කියැවෙන සරල ගී පාදයකි. iv. පොත් ගැන කියැවෙන ළමා ගී ගී පාදයකි.

02. දේශීය තිත් ක්‍රමයට අනුව තනි තිතෙහි ප්‍රභේද ගණන,
   i. 01 කි. ii.02 කි. iii.03 කි iv 04කි.

03. ස්වර සප්තකයක් තුළ ඇති කෝමල ස්වර හා තීව්‍ර ස්වර සංඛ්‍යා පිළිවෙලින්,
   i. කෝමල ස්වර 04ක් හා තීව්‍ර ස්වර 01 කි ii. කෝමල ස්වර 03ක් හා තීව්‍ර ස්වර 02 කි
   iii. කෝමල ස්වර 02ක් හා තීව්‍ර ස්වර 03 කි iv. කෝමල ස්වර 01ක් හා තීව්‍ර ස්වර 04 කි

04. මෙලෝඩිකා, විද්‍යුත් ඕගන්, හාර්මෝනියම් යන සංගීත භාණ්ඩවලට පොදු ලක්ෂණයකි,
   i. ඒවා සුෂිර වාද්‍ය භාණ්ඩ වීම. ii. ස්වර පුවරුවක් (Key Board) සහිත වීම.
   iii. විදුලිය සම්බන්ධ කළ විට නාදය නිකුත් වීම. iv වාදනය කිරීමට යම් උපකරණයක් භාවිත කිරීම.

05. ෂඩ්ජය හා පංචමය ස්වර සප්තකය තුළ නම් කරනුයේ,
   i. චල ස්වර වශයෙනි. ii. කෝමල ස්වර වශයෙනි.
   iii. තීව්‍ර ස්වර වශයෙනි iv. අචල ස්වර වශයෙනි.

- පහත 6 සිට 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා **A** තීරුවේ ඇති කරුණට සම්බන්ධතාවක් දක්වන **B** තීරුවේ ඇති කරුණ තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| 06. තාලයේ වේගය | a. හාර්මොනිකා |
| 07. නීතිඥ ජෝන්ද සිල්වා | b. සමග්‍රහය |
| 08. මවුත් ඕගන් | d. "ලය" වේ |
| 09. තාලයත් ගීතයත් එකවර ඇරඹේ | d. ඔළිඳ කෙළිය |
| 10. සිංහල ජන ක්‍රීඩා ආශ්‍රිත ගී වර්ගයකි. | e. රාමායනය |

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර වරහන් තුලින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.
  (මන්ද්‍ර ස්වර, විෂම ග්‍රහ, සමාජ ගී, වෙස් මුහුණු, උපදේශාත්මක ගී)

11. දරු නැලවිලි ගී.............................. ගණයට අයත් වේ.
12. .............................. ලියා දැක්වීමේදී ස්වරයට යටින් තිතක් තබනු ලැබේ.
13. ගීතය ආරම්භවීමෙන් පසුව තාල තැබීම ආරම්භ කිරීම.................................... නම් වේ.
14. කෝලම් නාටකයේ දී............................... භාවිත කරමින් රංගනයේ යෙදෙයි.
15. සිසුන්ගේ චර්යාවන් හා ආකල්ප වර්ධනයට ඉවහල්වන ගීත.................................ලෙස හඳුන්වයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

● අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා ගී පාදයට ගැලපෙන ගී වර්ගය හෝ ගී වර්ගයට ගැලපෙන ගී පාදය හෝ යොදා ගනිමින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ගී පාදය | අදාල ගී වර්ගය |
|---|---|
| 16. රත්නද්වීප ජන්ම භූමි | ............................................................ |
| 17. ............................................................ | ශුද්ධ ස්වර ස්ථාපන ගී. |
| 18. අතට වෙරළු ඇහිඳගෙනේ. | ............................................................ |
| 19. ............................................................ | නූර්ති ගී. |
| 20. ගම්හිර කාලිංග නුවර. | ............................................................ |

## II කොටස

● ඔබ කැමති ඕනෑම ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

(1)

(i) ඔබ උගත් කෝමල ස්වර ස්ථාපන ගීයක් ගීත ස්වර ප්‍රස්තාරය කරන්න. (ල. 08)

(ii) ඔබ උගත් ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක මුල් පද පේළිය ලියන්න. (ල. 02)

(2)

(i) "ග්‍රහ" යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල.01)

(ii) සමග්‍රහ, විෂම ග්‍රහ, අවග්‍රහ උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

පැහැදිලි කිරීමට 2x3 = 6 යි
උදාහරණ 1x3 = 3 යි
මුළු ලකුණු = 10 යි

(3)

(i) දරු නැලවිලි ගී හා රබන් ගී පිළිබඳ කරුණු තුන බැගින් ලියන්න. (3 x 2 = ල.06 යි)

(ii) ඉහත සඳහන් කළ ගී වර්ග දෙකෙන් කැමති වර්ගයකට අයත් ගීතයක් ලියා දක්වන්න. (ල.4)

(4)

(i) මාත්‍රා තුනෙන් තුන හා මාත්‍රා හතරෙන් හතර ගැයෙන ගීත දෙකක මුල් ගී පාදය වෙන් වෙන් වශයෙන් තාලානුකූලව පද ප්‍රස්තාර කර දක්වන්න (3 x 2 = ල. 06 යි)

(ii) ශුද්ධ ස්වර අභ්‍යාසයක් මධ්‍ය ෂඩ්ජයේ සිට උච්ඡ ෂඩ්ජය දක්වා වර්ධනය කර ලියා දක්වන්න. (ල. 04 යි)

(5) වැස්ස පිළිබඳ කියැවෙන පේළි 08 කින් යුතු ගී පද මාලාවක් නිර්මාණය කරන්න. (ල. 10 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 07 - 2023

### පෙරදිග සංගීතය - ප්‍රායෝගික පරීක්ෂණය.

නම / විභාග අංකය:

● ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලබා දෙන්න.

(01) ඔබ කැමති කෝමල ග, නි ස්වර සහිත ස්වර අභ්‍යාස ඇසුරින් නිර්මාණය වී ඇති ස්වර ස්ථාපන ගීතයක් ගායනය හෝ වාදනය කරන්න. (ල.10)

(02) උපදේශාත්මක ගී හෝ ළමා ගී අතරින් කැමති ගීයක් ගායනය හෝ වාදනය කරන්න. (ල.10)

(03) දරුනැළවිලි ගීයක් හෝ රබන් ගීයක් ගායනය කරන්න. (ල.10)

(04) නූර්ති ගීයක් හෝ කෝලම් ගීතයක් ගායනා කරන්න. (ල.10)

**(05) පහත සඳහන් ප්‍රශ්න අතුරින් එක් කොටසකට පිළිතුරු ඉදිරිපත් කරන්න.**

(i) තෝරා ගත් භාණ්ඩයකින් ඔබ කැමති ස්වර අභ්‍යාසයක් හෝ ස්වර ස්ථාපන ගීතයක් වාදනය කරන්න.

(ii) ස්වර පුවරු භාණ්ඩයකින් ඔබ කැමති ස්වර අභ්‍යාසයක් හෝ ස්වර ස්ථාපන ගීතයක් වාදනය කරන්න.

(I හෝ II කොටසකට ලකුණු 10යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com